**මිල්ලනිය ප්‍රාදේශීය සභාව**
**-----------------------------**
**කළුතර දිස්ත්‍රික්කය**
**----------------**

1. ගණුදෙනු වාර්තාව
------------------------

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2021 පෙබරවාරි 08 දින ද විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2021 පෙබරවාරි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

2 අනුකූල නොවීම්
------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්
---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | --------------------- | --------- | ----------- | ------------ | --------------------- |
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br><br>(i) 134(1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපල සම්බන්ධයෙන් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් පමණක් කර තිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතු වේ. | වරිපනම් කලාපය හඳුනාගැනීමට ආදායම් පරීක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර වරිපනම් ප්‍රදේශ කිහිපයක් හඳුනාගෙන තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 09 කට අදාල 2019 වර්ෂයේ ධාවන සටහන් විගණකාධිපති වෙත එවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | 2021.03.31 දිනට පෙර ධාවන සටහන් එවීමට කටයුතු කරමි. |

3 ආදායම් පරිපාලනය

---

3.1 මුද්දර ගාස්තු

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව මුද්දර ගාස්තු රු.1,178,000 ක් විය. | කඩිනමින් අය කර ගත යුතු වේ. | අයදුම් කරන සියළුම මුද්දර ගාස්තු සභාවට නොලැබෙන අතර ලබාදෙන මුද්දර ගාස්තු සහා අරමුදලට බැර කරමි. |

4 මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්ය සාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| (i) ක්‍රියාකාරි සැලැස්ම සැකසීම | | |
| 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ආ) වගන්තිය ප්‍රකාරව සභාව විසින් 2019 වර්ෂය සඳහා පිළියෙල කල ක්‍රියාකාරි සැලැස්ම තුල ඉදි කිරීම් පිරිවැය හා ඉදි කිරීම් කාල රාමුව විධිමත්ව හඳුනාගෙන නොතිබුණි | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම විධිමත්ව සකස් කල යුතුය. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| (ii) ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිරව ව්‍යාපෘති ඉටු කිරිම | | |
| • බාහිර ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කිරිම සඳහා ව්‍යාපෘති 17 ක් ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගෙන තිබුණද , එම ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර බාහිර ප්‍රතිපාදන යටතේ පිරිවැය රු.12,360,000 ක් වූ ව්‍යාපෘති 20 ක් ක්‍රියාකාරි සැලැස්මෙන් පරිහාහිරව ඉටු කර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කල යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාකාරි සැලැස්මේ ව්‍යාපෘති සංශෝධනය වේ නම් සැලැස්මක් අනුව ක්‍රියා කරමි. |

| | | |
|---|---|---|
| • සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති හඳුනා ගැනීමක් සිදු කර අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් කලයුතු වුවද, එවැනි ව්‍යාපෘති හඳුනාගැනීමක් හා ප්‍රතිපාදන වෙන් කිරිමකින් තොරව පිරිවැය රු.1,311,807 ක් වූ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති හඳුනාගෙන පිරිවැය අයවැය ලේඛනගත කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (iii) ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය<br>------------------------------ | | |
| සමාලෝචිත වර්ෂය තුල වැඩ සටහන් 05 ක් යටතේ ව්‍යාපෘති 96 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගෙන වගකීම් හා අධික්ෂණය පවරා තිබුණ ද එහි ප්‍රගතිය මිණුම් කිරිමට ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය මිණුම් කිරිමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය. | ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය නිවැරදි කිරිමට සටහන් කර ගතිමි. |
| (ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය<br>---------------------------------- | | |
| (i) කසළ කළමනාකරණය සඳහා සෞඛ්‍ය සේවා වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කිරිමට ක්‍රියාකාරකම් 07 ක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කලද, එම ක්‍රියාකාරකම් වෙනුවෙන් ඇස්තමේන්තු වියදම් හඳුනාගෙන වාර්ෂික අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | කසළ කළමනාකරණ සැලැස්ම තුල හඳුනාගත් ක්‍රියාකාරකම් වාර්ෂික අයවැය ඇස්තමේන්තු වලට ඇතුලත් කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට සටහන් කර ගතිමි. |
| (ii) මෙහිදී කසළ කළමනාකරණය විධිමත් කිරිම සඳහා අරමුණු 04 ක් යටතේ හඳුනාගත් ක්‍රියාකාරකම් 07 හි වගකීම් හා අධික්ෂණය සඳහා නිලධාරින් පත්කර තිබුණ ද එම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මිනුම්කර පසු විපරම් කිරීම් සිදු කර නොතිබුණි. | කසළ කළමනාකරණ සැලැස්මේ ප්‍රගතිය මිණුම් කර පසු විපරම් කලයුතු වේ. | අදහස් දක්වා නොමැත.. |
| (ඇ) තිරසර සංවර්ධනය<br>----------------------------- | | |
| (i) තිරසර සංවර්ධන වැඩ සටහන් යටතේ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කිරිමට හඳුනාගෙන තිබුණ ද ශක්‍යතා වාර්තාවක් සකස් කර අනුමැතිය ලබාගෙන වාර්ෂික අයවැය ලේඛනයට ඇතුලත් කර ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධනය ව්‍යාපෘති හඳුනාගෙන අනුමැතිය ලබාගෙන අයවැය ලේඛනගත කර ක්‍රියාත්මක කලයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) ළමා හා මාතෘ සායන හා පානීය ජල පහසුකම් ලබාදීමේ වැඩ සටහන් දෙක සඳහා රු.100,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද ඒවා සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, හඳුනාගත් ඉතිරි ව්‍යාපෘති 06 සඳහා රු.460,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර ක්‍රියාකාරකම් 09 ක් යටතේ ක්‍රියාත්මක කිරිමට සැලසුම් කලද එම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය ඉලක්ක ගත දර්ශක අනුව ලබා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හඳුනාගත් තිරසර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කලයුතු අතර ව්‍යාපෘති ප්‍රගතිය මිණුම් කිරිමට කටයුතු කලයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

4.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ ලේකම් තනතුර 2019 ජුනි 25 දින සිට පුරප්පාඩු වී පැවතුණ අතර රාජකාරි ආවරණය කිරිම සඳහා නිලධාරිනියක පත්කර තිබුණි. | ලේකම් තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කල යුතු වේ. | පත්වීම් බලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර අනුයුක්ත කිරිම පළාත් පාලන ලේකම් විසින් කලයුතු බව දන්වමි. |
| (ආ) මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුරක් , වැඩ පරිපාලක තනතුරක් , රියදුරු එක් තනතුරක් , කාර්යාල කාර්ය සහායක එක් තනතුරක් , වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු තුනක් හා සෞඛ්‍ය තනතුරක් පුරප්පාඩු වී තිබුණු අතර කළමනාකරණ සහකාර තනතුරක් අතිරික්ත වී තිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී නිවැරදි කරමි. |

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වත්කම් , වගකිම් නිරවුල් කර නොගැනීම | | |
| 2018 මාර්තු 20 දිනෙන් පසුව නව ප්‍රාදේශිය සභාවක් ලෙස ස්ථාපිත වු මිල්ලනිය ප්‍රාදේශිය සභාවට බණ්ඩාරගම ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු වත්කම් , වගකිම් , ආදායම් හා වියදම් නිසි පරිදි බෙදා වෙන් කර ලබාදීම 2020 දෙසැම්බර් 20 දින දක්වාම සිදු නොවීම නිසා මිල්ලනිය ප්‍රාදේශිය සභාවේ ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරිම , සභාවට අයිති ඉඩම් හා ගොඩනැගිලි පොත් වලට ගැනීම හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම හා අනෙකුත් වත්කම් , වගකීම් පිලිබඳ නිසි තහවුරුවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | වත්කම්, වගකීම් හා ආදායම් , වියදම් නිසි පරිදි බෙදා නිවැරදිව ලේඛනගත කල යුතුවේ. | වත්කම් බෙදා දීම සම්බන්ධව පළාත් පාලන නිලධාරින් දැනුවත් කර තිබුණි. |
| (ආ) වාහන භාවිතය | | |
| සභාව පරිහරණය කර වාහන 09 න් වාහන 03 ක් බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව නමින් ලියාපදිංචි වි ඇති අතර එක් වාහනයක් ප්‍රධාන ලේකම් කාර්යාලය නමින් ලියාපදිංචි වි තිබුණි. | සභාව විසින් වාහන ලියාපදිංචි කිරිමට කටයුතු කල යුතු වේ. | වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වමි. |

(ඇ) පරිසර බලපත්‍ර නිකුත් කිරීම

------------------------------

| | | |
|---|---|---|
| (i) පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සභාව විසින් විධිමත්ව සිදු කර නොතිබූ අතර නිවැරදි සමීක්ෂණයක් සිදු කරමින් පරිසර බලපත්‍ර ලබාගතයුතු කර්මාන්ත හඳුනාගැනීමට හෝ ඇගයීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි සමීක්ෂණයක් සිදු කර පරිසර බලපත්‍ර ලබාගතයුතු කර්මාන්ත හඳුනා ගැනීමට කටයුතු කල යුතු වේ. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට ලිඛිතව දැනුවත් කර ඇත. |
| (ii) 2019 වර්ෂයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු කර්මාන්ත 97 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම කර නොතිබුණ අතර , එම කර්මාන්ත සඳහා වෙළඳ බලපත්‍රය ලබාගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යමින් තිබුණි. | පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කලයුතු වේ. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට ප්‍රථම වෙළඳ බලපත්‍ර ලබාගත යුතු බව දැනුවත් කර තිබූ අතර පරිසර බලපත්‍ර ලබා ගැනීමට ආයතන 39 ක් දැනුවත් කර තිබුණි. |
| (iii) 2019 වර්ෂයේදී එක් පරිසර කමිටුවක් පමණක් පවත්වා තිබීම නිසා පරිසර බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවතුණි. | පරිසර කමිටු පවත්වා පරිසර බලපත්‍ර ලබාදීමේ කටයුතු විධිමත් කලයුතු වේ. | 2021 වර්ෂයේදී ගැටළු හඳුනාගෙන මෙම කටයුතු විධිමත් කිරීමට පියවර ගනිමි. |

(ඈ) ප්‍රජා මණ්ඩල පිහිටුවීම

--------------------------

| | | |
|---|---|---|
| (i) ප්‍රජා මණ්ඩල පිහිටුවීම , පවත්වාගෙන යාම සහ ඒවායේ කාර්යය කටයුතු වලට සියළුම ආකාරයේ සහායයන් පූර්ණ වශයෙන් ලබාදීම සෑම පළාත් පාලන ආයතනයකම ප්‍රමුඛ වගකීමක් වන අතර මිල්ලනිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවතින ග්‍රාමසේවක කොට්ඨාශ 44 න් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 21 ක පමණක් ප්‍රජා මණ්ඩල පිහිටුවා තිබුණි. | ප්‍රජා මණ්ඩල පිහිටුවා අවශ්‍ය කටයුතු විධිමත් කිරීම කල යුතු වේ. | කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රජා මණ්ඩල පිහිටුවීමට ප්‍රමාද වී තිබූ අතර දැනට ප්‍රජා මණ්ඩල පිහිටුවීමට කටයුතු කර ඇත. |
| (ii) පිහිටුවා ඇති ප්‍රජා මණ්ඩල වල පාලනය පිළිබඳ සම්පූර්ණ වගකීම පළාත් පාලන ආයතනය සතු වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරි, සභිකයින් තිදෙනෙක් හා ලියාපදිංචි ප්‍රජා මණ්ඩලයක ක්‍රියාකාරි සමාජිකයින් සිව් දෙනෙකුගෙන් යුතු අතුරු කමිටුවක් පිහිටුවා නොතිබුණි. | ප්‍රජා මණ්ඩල ක්‍රියාකාරිත්වය සඳහා අතුරු කමිටුවක් පිහිටුවිය යුතුය. | ප්‍රජා සංවර්ධන නිලධාරින් දැනුවත් වී නොමැති අතර ප්‍රජා මණ්ඩල අතුරු ව්‍යවස්ථාවේ ද සඳහන් වී නොමැති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ලියාපදිංචි සෑම ප්‍රජා මණ්ඩලයක් විසින්ම ත්‍රෛමාසික වාර්තාවක් පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කලයුතු වුවත් එක් ප්‍රජා මණ්ඩලයක්වත් ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රජා මණ්ඩල ත්‍රෛමාසික වාර්තා පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කලයුතු වේ. | කොරෝනා වසංගතය මත ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කිරිමට අපොහොසත් වුවද, පිහිටුවන ලද ප්‍රජා මණ්ඩල ක්‍රියාකාරිත්වයේ පවතින බව දන්වමි. |

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සභාව සතු මාර්ග හඳුනා නොගැනීම** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 21 වගන්තිය ප්‍රකාරව සභාව සතු සමස්ථ මාර්ග ප්‍රමාණය ග්‍රාමසේවා වසම් අනුව (තාර, කොන්ක්‍රීට්, බොරළු) හඳුනාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල පවතින ග්‍රාම සේවා වසම් 44 න් ග්‍රාම සේවා වසම් 14 ක මාර්ග හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුල පවතින මාර්ග ග්‍රාමසේවා වසම් අනුව හඳුනාගත යුතුය. | කොරෝනා තත්ත්වය මත ප්‍රමාද වුවද, 2021.02.28 වනවිට මිණුම් කටයුතු අවසන් කරන බව දන්වමි. |
| **(ආ) මාර්ග මිණුම් කර ගැසට් කිරිම** | | |
| මාර්ග ගැසට් කිරිමේ ක්‍රියාවලියට අනුව පෞද්ගලික පාරක්ද , පොදු පාරක්ද යන්න සොයා බලා පොදු පාරක් බවට තහවුරු කරවාගෙන මිනින්දෝරු සැලැස්මකට අනුව මාර්ග මිණුම් කර ගැසට් කලයුතු වුවත්, සභාව සතු මාර්ග විධිමත්ව මිණුම් කිරිමක් හෝ ගැසට් කිරීමක් සමාලෝචිත වර්ෂය තුල සිදු කර නොතිබුණි. | පොදු පාරක් බවට තහවුරු කර මාර්ග මිණුමු කර ගැසට් කලයුතු වේ. | මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැතිවීම හේතුවෙන් ඉදිරි වසර 05 තුල අවසන් කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| **(ඇ) මාර්ග ලේඛනගත කිරිම** | | |
| ප්‍රාදේශිය සභා පනතේ 21 (1) (2) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් මාර්ග හඳුනාගෙන මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කර එය යාවත්කාලීන කලයුතු වුවද, සභාව මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කර සමාලෝචිත වර්ෂය තුල ඉදිකර තිබුණු පිරිවැය රු.5,200,000 වු මාර්ග 08 ක් මාර්ග ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර යාවත්කාලින කර නොතිබුණි. | මාර්ග හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කර යාවත්කාලීන කල යුතුය. | මාර්ග මිණුම් කර ඉන්වෙන්ට්‍රිය සකස් කර ඉදිරියේදී අවසන් කරන බව |

4.5. ප්‍රසම්පාදනය

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම** | | |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර පිරිවැය රු.2,168,595 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා කර්මාන්ත අමුද්‍රව්‍ය වර්ෂය තුල මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව මිලදී ගැනීමට කටයුතු කලයුතු වේ. | 2020 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති බව දන්වමි. |
| **(ආ) ආදාහනාගාර සඳහා විදුලි උත්පාදන යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම** | | |
| (i) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තිය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපිට ලංසු විවෘත කර ඒ සඳහා වාර්තාවක් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ලබාදිය යුතු වුවද, ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ලබාදී තිබුණ තාක්ෂණික පිරිවිතර (තෝරාගත් සැපයුම්කරුගේ) අයිතම අංක 17 පිලිබඳ (පාලන පද්ධතිය) නිවැරදි තොරතුරු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ලබාදී නොතිබුණි. | ලංසු ඇගයීම සඳහා වාර්තා නිවැරදිව සකස් කර තාක්ෂණික ඇගයීම් සඳහා යොමු කල යුතු වේ. | කාර්යාල ප්‍රමාද දෝෂයක් හේතුවෙන් තොරතුරු ලබා දීමට මගහැරී ඇති බව දන්වමි. |
| (ii) විදුලි උත්පාදන යන්ත්‍රය 2020 මැයි 08 දින ක්‍රියා විරහිත වී ඇති බව ආදාහනාගාර භාර නිලධාරි දැනුම්දී තිබුණ ද අළුත්වැඩියා සිදු කර නොතිබුණි. | නොපමාව අළුත්වැඩියා කරගත යුතුවේ. | අළුත්වැඩියාව සඳහා මිලදීගත් ආයතනය දැනුවත් කර ඇති බව දන්වමි. |
| **(ඇ) විථී ලාම්පු උපකරණ මිලදී ගැනීම** | | |
| (i) 2019 වර්ෂය තුල මිලදී ගන්නා ලද රු.724,000 ක් වටිනා විථී ලාම්පු කට්ටල 280 ක් හා විශේෂිත ලාම්පු කට්ටල 29 ක් වෙනුවෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තිය ප්‍රකාරව පිරිවිතර සකස් කර මිල කැඳවීම් කර නොතිබුණි. | විථී ලාම්පු කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් පිරිවිතර සකස් කර මිල ගණන් කැඳවීම් කල යුතුය. | අළුතින් ස්ථාපිත කර තිබූ සභාවක් බැවින් පත්කර ඇති නිලධාරීන් නවක නිලධාරීන් වූ බැවින් මෙම තත්ත්වය ඇති වී තිබුණු අතර 2020 වර්ෂයේ සිට නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ii) විශේෂ විපී ලාම්පු කට්ටල 25 ක් මිලදී ගැනීම සඳහා 2019 මැයි මස මිල ගණන් කැඳවීම් කර අවස්ථා 02 කදී මිලදී ගෙන තිබුණි. එහිදී එක් සැපයුම්කරුවෙකුගේ මිල ගණන් පමණක් පදනම් කරගෙන මිලදී ගැනීම නිසා එම වර්ගයේ ලාම්පු කට්ටලයක් වෙනත් සභා විසින් ලබාගත් මිලට වඩා වැඩි මිලක් ගෙවීමට සිදු වීමෙන් එකකට රු.3,600 බැගින් කට්ටල 25 ක් වෙනුවෙන් රු.90,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | තරඟකාරිව මිල ගණන් කැඳවා අවම ගුණත්වයෙන් යුත් මිලකට මිලදී ගත යුතුය. | ප්‍රසම්පාදන නිතිරීති වලට අනුකූලව මිලදී ගැනීමට කටයුතු කරන බව දන්වමි. |